# මූලික පිරිවෙන්

# නව විෂය නිර්දේශය

# 08 - සමාජ විද්‍යාව

## 3 , 4 , 5 ශ්‍රේණි




පිරිවෙන් අධ්‍යාපන ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය

ඉසුරුපාය

බත්තරමුල්ල

# මූලික පිරිවෙන් විෂය නිර්දේශය

## 3 ශ්‍රේණිය - සමාජ විද්‍යාව

| නිපුණතා / නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය |
| --- | --- |
| **01. නිපුණතාව**<br>සමාජ විද්‍යාව පිළිබඳව ඇති විවිධ නිර්වචන සරල ව පැහැදිලි කරයි.<br>**නිපුණතා මට්ටම**<br>1.1 සමාජ විද්‍යාවේ බිහිවීම හා වර්ධනය සිදු වූ අයුරු අවබෝධ කර ගනියි.<br>1.2 සමාජ විද්‍යාවේ අරමුණ හා ප්‍රයෝජන තේරුම් ගනියි.<br>1.3 සමාජ විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය හඳුනාගෙන නම් කර, විස්තර කරයි.<br>1.4 සමාජ විද්‍යා දැනුම භික්ෂු ජීවිතයට ආයෝජනය කර ගනියි. | • සමාජ විද්‍යාවේ බිහිවීම හා විෂය වර්ධනය වූ ආකාරය.<br>• සමාජ විද්‍යාවේ අරමුණ හා ප්‍රයෝජන.<br>• සමාජ විද්‍යාවේ මූලික සංකල්ප හා එහි විෂය ක්ෂේත්‍රය.<br>• බෞද්ධ භික්ෂූන්ට සමාජ විද්‍යා දැනුමේ ඇති අවශ්‍යතාව. |
| **02. නිපුණතාව**<br>සමාජ පරිණාමය පිළිබඳ විමර්ශනය කරයි.<br>**නිපුණතා මට්ටම**<br>2.1 පැරණි අවධියේ සිට නූතන අවධිය දක්වා සමාජය වෙනස් වූ ආකාරය විස්තර කරයි.<br>2.2 සමාජ හා මානව විද්‍යාඥයන්ගේ මතවාද ඇසුරින් සමාජ වෙනස් වීම හඳුනා ගනියි.<br>2.3 බුදු දහම අනුව සියල්ල වෙනස් වන බවත් එමෙන් සමාජය වෙනස් වන අයුරුත් තේරුම් ගනියි.<br>2.4 පැරණි සමාජය නූතන සමාජය දක්වා වෙනස් වීමේ දී පන්සල් /පිරිවෙන් හා භික්ෂු සමාජය ආශ්‍රිතව සිදු වූ වෙනස්කම් විස්තර කරයි. | • පැරණි සමාජයේ හා නූතන සමාජවල ඇති ස්වභාවය<br>• සමාජ පරිණාමය පිළිබඳ සමාජ හා මානව විද්‍යාඥයින්ගේ මතවාද<br>• සමාජ පරිණාමය සිදුවන ආකාරය බෞද්ධ දෘෂ්ටි කෝණයෙන්<br>• විහාරස්ථානය /පිරිවෙන ආශ්‍රයෙන් සිදු වූ සමාජ වෙනස්වීම් |
| **03. නිපුණතාව**<br>සංස්කෘතිය යන්න පිළිබඳ අවබෝධ කර ගැනීම.<br>**නිපුණතා මට්ටම**<br>3.1 සංස්කෘතිය යන්න අවබෝධ කර ගනියි.<br>3.2 සමාජානුයෝජනය හා සංස්කෘතිය අතර සම්බන්ධතාව විස්තර කරයි.<br>3.3 බුදු දහම අපට අගනා සංස්කෘතියක් දායාද කර ඇති අයුරු තේරුම් ගනියි.<br>3.4 ශ්‍රී ලංකාවේ පවතින අනෙකුත් සංස්කෘතීන් පිළිබඳ සරල තුලනාත්මක අවබෝධයක් ලබා ගනියි. | • සංස්කෘතිය යන්න හඳුන්වා දීම.<br>• සමාජානුයෝජනය හා සංස්කෘතිය අතර සම්බන්ධය අවබෝධ කර ගනියි.<br>• බුදු දහමින් දායාද වූ ගති ලක්ෂණ මත සිංහල සංස්කෘතිය බෞද්ධ සංස්කෘතිය බවට පත් වූ ආකාරය දැන ගනියි.<br>• ශ්‍රී ලංකා සමාජයේ පවතින අනෙකුත් සංස්කෘතීන් පිළිබඳ මූලික තුලනාත්මක අධ්‍යයනය විමර්ශනය කරයි. |

| | |
|---|---|
| **04. නිපුණතාව**<br><br>පුද්ගලයා හා සමාජය අතර අන්තර් සම්බන්ධතා හඳුනා ගැනීම<br><br>**නිපුණතා මට්ටම** | |
| 4.1 පුද්ගලයා හා සමාජය අතර සම්බන්ධය තේරුම් ගනියි. | • පුද්ගලයා හා සමාජය අතර සම්බන්ධතාව |
| 4.2 සමාජය යනු කුමක්දැයි හඳුනා ගනියි. | • සමාජය යනු කුමක්දැයි නිර්වචනය කරයි. |
| 4.3 සමාජ විවිධත්වය හා සංකීර්ණත්වය අධ්‍යයනය කර වටහා ගනියි. | • සමාජ විවිධත්වය හා සංකීර්ණත්වය අවබෝධ කර ගනියි. |
| 4.4 බුදු දහම සමාජ සබඳතා ගැන දක්වන ආකල්පය තහවුරු කර ගනියි. | • බුදු දහම සමාජ සබඳතා ගැන දක්වන ආකල්පය වර්ධනය කර ගනියි. |
| **05. නිපුණතාව**<br><br>සමාජ පාලනය යන්න හඳුනා ගැනීම<br><br>**නිපුණතා මට්ටම** | |
| 5.1 සමාජ පාලනය හා එහි අවශ්‍යතාව පිරිවෙන / පන්සල ආශ්‍රිත සමාජය ඇසුරින් අවබෝධ කර ගනියි. | • සමාජ පාලනයක අවශ්‍යතාව වටහා ගනියි. |
| 5.2 චාරිත්‍ර වාරිත්‍ර සමාජ පාලන කාරකයක් ලෙස වැදගත් වන බව පිළිගනියි. | • සමාජ පාලනයෙහිලා චාරිත්‍ර වාරිත්‍රවල වැදගත්කම හඳුනාගනියි. |
| 5.3 සාරධර්ම සමාජ පාලනය සඳහා වැදගත්වන අයුරු අවබෝධ කර ගනියි. | • සාරධර්ම හා සමාජය අතර පවත්නා අන්තර් සම්බන්ධතාව වටහා ගනියි. |
| 5.4 බුද්ධ කාලීන සමාජයේ පැවැති සමාජ පාලන උපක්‍රම ඉදිරිපත් කරයි. | • පාලනයෙහිලා බුදු දහමේ දැක්වෙන භික්ෂූන් වහන්සේලාගේ කාර්යභාරය අවබෝධ කර ගනියි. |
| **06. නිපුණතාව**<br><br>සමාජ ප්‍රශ්න හඳුනා ගැනීම<br><br>**නිපුණතා මට්ටම** | |
| 6.1 සමාජ ප්‍රශ්න යනු මොනවාදැයි හඳුනා ගනියි. | • සමාජ ප්‍රශ්න යනු මොනවාදැයි හඳුනා ගනියි. |
| 6.2 දුගී භාවය සමාජ ප්‍රශ්නයක් ලෙස අධ්‍යයනය කරයි. | • දුගී භාවය සමාජ ප්‍රශ්නයක් ලෙස හඳුනා ගනියි. |
| 6.3 වයස්ගත වුවන් පිළිබඳ තත්ත්වය සමාජ ප්‍රශ්නයක් ලෙස අවබෝධ කර ගනියි. | • වයස්ගත වුවන් පිළිබඳ තත්ත්වය සමාජ ප්‍රශ්නයක් දක්වා වර්ධනය වන අන්දම පැහැදිලි කර ගනියි. |
| 6.4 මෙම සමාජ ප්‍රශ්න දෙක සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ තත්ත්වය හා ඒ පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් විමර්ශනය කරයි. | • මෙම සමාජ ප්‍රශ්න සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ තත්ත්වය හා ඒ පිළිබඳ බෞද්ධ ඉගැන්වීම විමර්ශනය කරයි. |

## 07. නිපුණතාව

සමාජය අධ්‍යයනය කිරීම සඳහා විද්‍යාත්මක ප්‍රවේශයක් යොදා ගැනීම

### නිපුණතා මට්ටම

7.1 සමාජය හා පුද්ගලයා අතර සම්බන්ධතාවය හඳුනාගනියි.

7.2 බුදු දහමේ පිළිබිඹුවන පැවිදි හා ගිහි සම්බන්ධතාව සමාජ විද්‍යාත්මකව අගය කරයි.

7.3 බටහිර ජාතීන්ගේ ආගමනයෙන් පැවිදි ගිහි සම්බන්ධතාවයට සිදු වූ බලපෑම අවබෝධ කර ගනියි.

7.4 පිරිවෙන /පන්සල අවට සමාජයේ යහපත උදෙසා භික්ෂූවගේ කාර්ය භාර්ය අවබෝධ කරගෙන ඒ සඳහා කටයුතු කරයි.

- සමාජය හා පුද්ගලයා අතර සම්බන්ධය
- බුදු දහමේ දක්වෙන පැවිදි ගිහි සම්බන්ධය දත ගනියි.
- බටහිර ජාතීන්ගේ ආගමනයෙන් ඊට ඇති වූ බලපෑම අවබෝධ කර ගනියි.
- පිරිවෙන /පන්සල අවට සමාජයේ යහපත උදෙසා භික්ෂූවගේ කාර්ය භාර්ය අවබෝධ කර ගනියි.

# මූලික පිරිවෙන් විෂය නිර්දේශය

## 4 ශ්‍රේණිය - සමාජ විද්‍යාව

| නිපුණතා / නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය |
|---|---|
| **01. නිපුණතාව**<br>සමාජ විද්‍යාව යන්න විවිධ නිර්වචන ඇසුරින් දැන ගැනීම<br>**නිපුණතා මට්ටම** | |
| 1.1 සමාජ විද්‍යාව නිර්වචන ඇසුරින් පැහැදිලි කර ගනියි. | • සමාජ විද්‍යාව පිළිබඳ නිර්වචන ඉදිරිපත් කරයි. |
| 1.2 සමාජ විද්‍යාව බිහි වූ බටහිර සමාජ පසුබිම අධ්‍යනය කොට අවබෝධය ලබා ගනියි. | • සමාජ විද්‍යාව විෂය බිහිකළ තත්කාලීන බටහිර සමාජ හඳුනා ගනියි. |
| 1.3 ස්වභාවික විද්‍යාව හා සමාජීය විද්‍යා අතර වෙනස්කම් හඳුන්වා දෙයි. | • ස්වභාවික විද්‍යාව හා සමාජීය විද්‍යා අතර සමාජ විද්‍යාවට හිමි තැන දැන ගනියි. |
| 1.4 බෞද්ධ සමාජ විද්‍යාත්මක චින්තනය අධ්‍යයනය කර අවබෝධ කර ගනියි. | • බෞද්ධ සමාජ චින්තනය පිළිබඳ අවබෝධය ලබා ගනියි. |
| **02. නිපුණතාව**<br>සමාජ පරිණාමය හඳුනා ගැනීම.<br>**නිපුණතා මට්ටම** | |
| 2.1 සියලු සමාජ නිරතුරුව වෙනස් වෙමින් පවතින බව තේරුම් ගනියි. | • සමාජය පරිණාමය වන අයුරු (සමාජ විද්‍යාඥයින්ගේ නිර්වචන ඇසුරින්) දැන ගනියි. |
| 2.2 පැරණි සමාජය නූතන සමාජය දක්වා පරිණාමය වූ අයුරු පැහැදිලි කර ගනියි. | • පැරණි සමාජය නූතන සමාජය දක්වා පරිණාමය වූ ආකාරය අවබෝධ කර ගනියි. |
| 2.3 සමාජ වෙනස් වීම කෙරෙහි විවිධ හේතු බලපාන බව අවබෝධකර ගනියි. | • සමාජ පරිණාමය කෙරෙහි බලපා ඇති සාධක (නවීකරණය, නාගරීකරණය, කාර්මීකරණය) දැන ගනියි. |
| 2.4 සමාජ පරිණාමය කෙරෙහි බුදුදහමේ බලපෑම විස්තර කරයි. | • සමාජ පරිණාමය කෙරෙහි බුදු දහමේ බලපෑම වැදගත් වූ ආකාරය තේරුම් ගනියි. |
| **03. නිපුණතාව**<br>සංස්කෘතිය යන්න අවබෝධ කර ගැනීම<br>**නිපුණතා මට්ටම** | |
| 3.1 සංස්කෘතිය යනු කුමක්දැයි නිර්වචන ඇසුරින් හඳුනා ගැනීම | • සංස්කෘතිය යනු කුමක්දැයි නිර්වචනය ඇසුරින් හඳුනා ගැනීම |
| 3.2 සංස්කෘතියට අදාළ විවිධ ගති ලක්ෂණ අවබෝධ කර ගනියි. | • සංස්කෘතියක් තුළ දක්නට ඇති උප සංස්කෘතීන් දැන ගැනීම |
| 3.3 සමාජය පවත්වා ගැනීමෙහිලා සංස්කෘතියේ බලපෑම පැහැදිලි කර ගනියි. | • සමාජය පවත්වා ගැනීමේ ලා සංස්කෘතියේ බලපෑම හේතු වන බව අවබෝධ කර ගැනීම |
| 3.4 ලාංකේය සංස්කෘතිය කෙරෙහි වූ විදේශීය බලපෑම් පැහැදිලි කර ගනියි. | • ලාංකේය සංස්කෘතිය කෙරේ ඇති වූ විදේශීය බලපෑම් (ඉන්දීය හා යටත් විජිත යුගයන්හි බලපෑම) දැන ගනියි. |

| | |
|---|---|
| **04. නිපුණතාව**<br><br>පුද්ගලයා හා සමාජය අතර අන්තර් සම්බන්ධතාව හඳුනා ගැනීම<br><br>**නිපුණතා මට්ටම** | |
| 4.1 පුද්ගල ජීවිතය කෙරෙහි බලපාන සමාජ පසුබිම අධ්‍යයනය කරයි. | • පුද්ගල ජීවිතය හා සමාජ පසුබිම |
| 4.2 බහු වාර්ගික, බහුවිධ සමාජ හා සමාජ සංකීර්ණත්වය හඳුනාගෙන අවබෝධ කර ගනියි. | • බහුවිධ සමාජ හා සමාජ සංකීර්ණත්වය |
| 4.3 ලාංකේය සමාජයෙහි විවිධත්වය පැහැදිලි කර ගනියි. | • ශ්‍රී ලංකා සමාජයෙහි විවිධත්වය |
| 4.4 බුදු දහම හා සමාජ ජීවිතය අතර සම්බන්ධය තේරුම් ගනියි. | • බුදු දහම හා සමාජ ජීවිතය |
| **05. නිපුණතාව**<br><br>සමාජ පාලනය යන්න අවබෝධ කර ගනියි.<br><br>**නිපුණතා මට්ටම** | |
| 5.1 සමාජ පාලනයක අවශ්‍යතාව ග්‍රාමීය හා නාගරික සමාජ ඇසුරින් දැන ගනියි. | • සමාජ පාලනයක අවශ්‍යතාව - ග්‍රාමීය හා නාගරික සමාජ ඇසුරින් අවබෝධ කර ගනියි. |
| 5.2 ආගමික සංස්ථාව සමාජ පාලනයෙහිලා ලාංකේය සමාජයට ඇති කරන බලපෑම හඳුනා ගනියි. | • ආගමික සංස්ථාව සමාජ පාලනයට ඇති කරන බලපෑම ලාංකේය සමාජයට ඇති කරන බලපෑම හඳුනා ගනියි. |
| 5.3 අධ්‍යාපනයේ බලපෑම නිසා සමාජ පාලනය වන අන්දම තේරුම් ගනියි. | • සමාජ පාලනය කෙරේ අධ්‍යාපනයේ වැදගත්කම අවබෝධ කර ගනියි. |
| 5.4 සමාජ පාලනය භික්ෂු දායකත්වය හා බුද්දහමෙන් ලැබෙන ආභාසය පැහැදිලි කර ගනියි. | • බුදු දහම හා භික්ෂු දායකත්වය සමාජ පාලනයෙහිලා ඇති කරන බලපෑම අවබෝධ කර ගනියි. |
| **06. නිපුණතාව**<br><br>සමාජ ප්‍රශ්න හඳුනා ගැනීම<br><br>**නිපුණතා මට්ටම** | |
| 6.1 සමාජ ප්‍රශ්න යනු මොනවාදැයි හඳුනාගනියි. | • සමාජ ප්‍රශ්න හඳුනා ගනියි. |
| 6.2 සමාජ ප්‍රශ්නයක් වශයෙන් සියදිවි නසාගැනීම පිළිබඳව අධ්‍යයනය කරයි. | • සියදිවි නසා ගැනීම සමාජ ප්‍රශ්නයක් ලෙස අවබෝධ කර ගනියි. |
| 6.3 සමාජ ප්‍රශ්නයක් වශයෙන් පවත්නා HIV /ඒඩ්ස් රෝගය පිළිබඳ කතු විමසයි. | • HIV /ඒඩ්ස් රෝගය සමාජ ප්‍රශ්නයක් ලෙස වටහා ගනියි. |
| 6.4 ඉහත සමාජ ප්‍රශ්න ලාංකේය සමාජය තුළ පවත්නා මට්ටම හා ඒවා නිවාරණය පිළිබඳ බෞද්ධ අභාසය විමසා බලයි. | • ඉහත සමාජ ප්‍රශ්න ලාංකේය සමාජය කෙරේ ඇති කරන බලපෑම හා ඒවා නිවාරණය සඳහා බෞද්ධ මාර්ගෝපදේශවල වැදගත්කම තේරුම් ගනියි. |

| | |
|---|---|
| **07. නිපුණතාව**<br>**සමාජ සංවිධානය පිළිබඳ සමාජ විද්‍යාත්මක ප්‍රවේශය හඳුනා ගැනීම**<br>**නිපුණතා මට්ටම** | |
| 7.1 සමාජ විද්‍යාත්මක පර්යේෂණවල අවශ්‍යතාව හඳුනාගනියි. | • සමාජ විද්‍යාත්මක පර්යේෂණවල අවශ්‍යතාව හඳුනා ගනියි. |
| 7.2 සමාජ විද්‍යාත්මක පර්යේෂණ ක්‍රමවේදය අධ්‍යයනය කරයි. | • සමාජ විද්‍යාත්මක පර්යේෂණ ක්‍රමවේද අධ්‍යයනය කරයි. |
| 7.3 නිරීක්ෂණය තොරතුරු රැස්කිමේ ක්‍රම වේදයක් ලෙස භාවිතා කරයි. | • නිරීක්ෂණය තොරතුරු රැස්කිරීමේ ක්‍රමවේදයක් අවබෝධ කර ගනියි. |
| 7.4 සාකච්ඡාව තොරතුරු රැස්කිරීමේ ක්‍රමවේදයක් ලෙස යොදා ගනියි. | • සම්මුඛ සාකච්ඡාව තොරතුරු රැස් කිරීමේ ක්‍රමවේදයක් ලෙස යොදා ගනියි. |

# මූලික පිරිවෙන් විෂය නිර්දේශය

## 5 ශ්‍රේණිය - සමාජ විද්‍යාව

| නිපුණතා / නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය |
|---|---|
| **01. නිපුණතාව**<br>සමාජ විද්‍යාව යන්න හඳුනා ගැනීම<br>**නිපුණතා මට්ටම**<br>1.1 නිර්වචන ඇසුරින් සමාජ විද්‍යාව යනු කුමක්දැයි පැහැදිලි කර ගනියි.<br>1.2 සමාජ විද්‍යාව විෂයක් ලෙස වර්ධනය වූ ආකාරය අවබෝධ කර ගනියි.<br>1.3 සමාජ විද්‍යා දැනුම සමාජීය ව්‍යවහාර වල දී උපයෝගී කරගත හැකි අයුරු පැහැදිලි කර ගනියි.<br>1.4 බෞද්ධ සමාජ විද්‍යාව නව විෂයක් ලෙස හඳුනාගෙන අවබෝධ කර ගනියි. | • සමාජ විද්‍යාව නිර්වචන ආශ්‍රිතව හඳුනා ගනියි.<br>• සමාජ විද්‍යාව විෂයයක් ලෙස සංවර්ධනය වූ ආකාරය අවබෝධ කර ගනියි.<br>• සමාජ විද්‍යා දැනුම උපයෝගී කරගත හැකි ආකාරය පැහැදිලි කර ගනියි.<br>• බෞද්ධ සමාජ විද්‍යාව යන්න හඳුනා ගනියි. |
| **02. නිපුණතාව**<br>සමාජ පරිණාමය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම<br>**නිපුණතා මට්ටම**<br>2.1 සමාජය නිරතුරුවම වෙනස් වන ස්භාවය දැන ගනියි.<br>2.2 සමාජ පරිණාමය විවිධ සමාජ විද්‍යාඥයින්ගේ නිර්වචන ආශ්‍රයෙන් තේරුම් ගනියි.<br>2.3 සමාජ පරිණාමය කෙරේ විවිධ සාධකවල බලපෑම අවබෝධ කර ගනියි.<br>2.4 ශ්‍රී ලාංකික සමාජ පරිණාමය කෙරේ බෞද්ධාගමික බලපෑම හඳුනා ගනියි. | • සමාජ පරිණාමය යනු කුමක්දැයි අවබෝධ කර ගනියි(විවිධ සමාජ හා මානව විද්‍යාඥයිගේ නිර්වචන ඇසුරින් )<br>• කෙටිකාලීන හා දිගු කාලීනව සමාජය වෙනස් වූ (පරිණාමය) ආකාරය,සමාජ විද්‍යාඥයිගේ මතවාද ඇසුරින් අවබෝධ කර ගනියි.<br>• සමාජ පරිණාමය කෙරෙහි බලපෑ සාධක හඳුනා ගනියි.(නවීකරණය,නාගරීකරණය,කාර්මීකරණය)<br>• බුදු දහම ඇසුරින් ශ්‍රී ලංකික සමාජය පරිණාමය වූ අයුරු අවබෝධ කර ගනියි. |
| **03. නිපුණතාව**<br>සංස්කෘතිය යන්න අවබෝධ කර ගනියි.<br>**නිපුණතා මට්ටම**<br>3.1 සමාජ විද්‍යාඥයින්ගේ මතවාද ඇසුරින් සංස්කෘතිය යනු කුමක්දැයි තේරුම් ගනියි.<br>3.2 සංස්කෘතියට ආවේණික විවිධ ලක්ෂණ අවබෝධ කර ගනියි.<br>3.3 සංස්කෘතිය පුද්ගල හැසිරීම හා පෞර්ෂය වර්ධනය කෙරේ ඇති කරන බලපෑම අවබෝධ කර ගනියි.<br>3.4 ගෝලීය ප්‍රවණතා හමුවේ ලාංකේය සංස්කෘතියට සිදුවන බලපෑම් පැහැදිලි කර ගනියි. | • සංස්කෘතිය සමාජ විද්‍යාත්මක දෘෂ්ටි කෝණයෙන් නිර්වචන ආශ්‍රිතව හඳුනා ගනියි.<br>• සංස්කෘතියේ අන්තර්ගත ලක්ෂණ දැනගනියි<br>✓ සංස්කෘතික ගැටුම<br>✓ සංස්කෘතික විසරණය<br>✓ සංස්කෘතික ලැග්ම<br>✓ සංස්කෘතිය හා සමාජය<br>• පුද්ගල පෞරුෂය හා සංස්කෘතිය පවරා දීම යන්න පැහැදිලි කර ගනියි.<br>• ගෝලීය ප්‍රවණතා හමුවේ ශ්‍රී ලංකේය සංස්කෘතියට ඇතිවන බලපෑම තේරුම් ගනියි. |

| | |
|---|---|
| **04. නිපුණතාව** | |
| පුද්ගලයා හා සමාජය අතර පවත්නා අන්තර් සම්බන්ධතා හඳුනා ගනියි. | |
| **නිපුණතා මට්ටම** | |
| 4.1 ශ්‍රී ලංකා සමාජය හා එහි ප්‍රභවය හා පරිණාමය සිදු වූ ආකාරය දැන ගනියි. | • ශ්‍රී ලංකා සමාජය හා එහි පරිණාමය හඳුනා ගනියි. |
| 4.2 ශ්‍රී ලංකාවේ පුරාතන සමාජ ව්‍යුහය හඳුනාගෙන පැහැදිලි කරයි. | • පැරණි සමාජයේ ව්‍යුහය පිළිබඳ අවබෝධයක් ලබා ගනියි. |
| 4.3 ශ්‍රී ලංකාවේ නූතන සමාජ ව්‍යුහය සකස් වී ඇති අයුරු දැන ගනියි. | • ශ්‍රී ලාංකික සමාජයේ නූතන ව්‍යුහය පිළිබඳ අවබෝධයක් ලබා ගනියි. |
| 4.4 යුක්තිය හා සමාජ සාධාරණත්වය සඳහා බුදු දහමේ ඇති සමාජ විද්‍යාත්මක වැදගත්කම පැහැදිලි කර ගනියි. | • සමාජ සාධාරණත්වය, යුක්තිය සඳහා බෞද්ධ සමාජ විද්‍යාත්මක උපයෝගීතාව බලපාන අයුරු දැන ගනියි |
| **05. නිපුණතාව** | |
| පාලනයක අවශ්‍යතාවය දැන ගැනීම. | |
| **නිපුණතා මට්ටම** | |
| 5.1 සමාජ පාලනයක අවශ්‍යතාව හා එහි ඓතිහාසික විකාශනය අවබෝධ කර ගනියි. | • සමාජ පාලනයක අවශ්‍යතාව හා එහි ඓතිහාසික විකාශනය අවබෝධ කර ගනියි. |
| 5.2 සමාජ පාලනය සඳහා නීති පද්ධතිය විසින් කෙරෙන බලපෑම පැහැදිලි කර ගනියි. | • නීති පද්ධතිය විසින් කෙරෙන සමාජ පාලනය පැහැදිලි කර ගනියි. |
| 5.3 ශ්‍රී ලංකාවේ නූතන සමාජ පාලන ව්‍යුහය අධ්‍යයනය කර ගනියි. | • නූතන සමාජ පාලන ව්‍යුහය පිළිබඳ අවබෝධයක් ලබා ගනියි. |
| 5.4 බෞද්ධ ඉගැන්වීම් තුළින් එළි දක්වෙන ස්වයං පාලනය හා නූතන සමාජ පාලනය කෙරේ එහි ව්‍යවහාරික වැදගත්කම පැහැදිලි කර ගනියි. | • සමාජ පාලනය කෙරේ බෞද්ධ ඉගැන්වීම් වලින් දක්වෙන ස්වයං පාලනයේ වැදගත්කම තේරුම් ගනියි. |
| **06. නිපුණතාව** | |
| සමාජ ප්‍රශ්න හඳුනා ගැනීම | |
| **නිපුණතා මට්ටම** | |
| 6.1 සමාජ ප්‍රශ්න යනු මොනවාදැයි හඳුනාගනියි. | • සමාජ ප්‍රශ්න හඳුනා ගනියි. |
| 6.2 සමාජ ප්‍රශ්නයක් වශයෙන් පවතින අපරාධ පිළිබඳව අධ්‍යයනය කරයි. | • අපරාධ පිළිබඳ ගැටළුව සමාජ ප්‍රශ්නයක් ලෙස අධ්‍යයනය කරයි. |
| 6.3 සමාජ ප්‍රශ්නයක් වශයෙන් පවතින ජනවාර්ගික අර්බුදය පිළිබඳ අධ්‍යයනය කරයි. | • ජනවාර්ගික අර්බුදය සමාජ ප්‍රශ්නයක් ලෙස අවබෝධ කර ගනියි. |
| 6.4 ඉහත සමාජ ප්‍රශ්න ලාංකික සමාජය තුළ පවත්නා මට්ටම් හා ඒවා නිවාරණය පිළිබඳ ආභාසය හඳුනා ගනියි. | • ඉහත සමාජ ප්‍රශ්න ලාංකික සමාජය තුළ උද්ගතව ඇති මට්ටම හා ඒවා නිවාරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් හේතු වන බව දැන ගනියි. |

| | |
|---|---|
| **07. නිපුණතාව**<br><br>**සමාජ සංවිධානය පිළිබඳ සමාජ විද්‍යාත්මක ප්‍රවේශය හඳුනා ගැනීම**<br><br>**නිපුණතා මට්ටම** | |
| 7.1 සමාජ විද්‍යාත්මක පර්යේෂණයන් සැලසුම් කර ගනියි. | • සමාජ විද්‍යා පර්යේෂණයක් සැලසුම් කිරීම |
| 7.2 මූලාශ්‍ර භාවිතය පිළිබඳ කරුණු අධ්‍යයනය කරයි. | • මූලාශ්‍ර භාවිතය |
| 7.3 දත්ත එක් රැස්කිරීම පිළිබඳ නිර්ණායකයන් වටහා ගනියි. | • දත්ත රැස්කිරීම |
| 7.4 සරල සමාජ විද්‍යා පර්යේෂණවල නිරතව නිබන්ධයක් ඉදිරිපත් කරයි. | • සරල සමාජ විද්‍යා පර්යේෂණයක නිරතව නිබන්ධයක් ඉදිරිපත් කිරීම |